# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1988/21- 2016 ඔක්තෝබර් මස 12 වැනි බදාදා - 2016.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ ප්‍රකාශය

*මාගේ අංකය* : ව/18/84/2011/11.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තිය (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, රාගම්පත්තුව සුළු කොට්ඨාසයේ, නවම්මහර ගමේ පිහිටි මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක ගම්. 3992 හා 2016-05-12 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 සහ 02 වශයෙන් පෙන්නුම් කර ඇති මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.5040 ක් පමණ වූ පහත විස්තර කෙරෙන ඉඩම් කැබලි.

01. **කැබලි අංක 01**
ඉඩමේ නම:—; විස්තරය: ඇළ; හිමිකම් කියන අය: අංක 10, හම්සා පටුමග, මුතුවෙල මාවත, කොළඹ 15 පදිංචි අබ්දුල් ගෆූර් අනාස්; මුල් හිමිකම් කියන අය:—; ප්‍රමාණය: හෙක්ටයාර් 0.1020

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: කජුගහකුඹුර; විස්තරය: විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: අංක 10, හම්සා පටුමග, මුතුවෙල මාවත, කොළඹ 15 පදිංචි අබ්දුල් ගෆූර් අනාස්; මුල් හිමිකම් කියන අය:—; ප්‍රමාණය: හෙක්ටයාර් 0.4020

ඉහත සඳහන් ඉඩම්වලට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2016 ඔක්තෝබර් මස 31 වැනි දින පෙ.ව. 10.00 ට වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තවද, 2016 ඔක්තෝබර් මස 31 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල් හා එය ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩබ්ලිව්. ජී. ප්‍රේමලාල්,
ප්‍රාදේශීය ලේකම්,
වත්තල.

2016 ඔක්තෝබර් මස 07 වැනි දින,
වත්තල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 1650


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1A - G 24356 - 47 - (2016/10)

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : BD/EL/LND/1/AQUSN/15.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4/3/9/2012/WS/197.

උක්ත ශිර්ෂය යටතේ 2015 පෙබරවාරි මස 11 වැනි දින ම විසින් අංක 1901/10 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* අංක 02 - 727 යටතේ පළ කරන ලද ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ දැන්වීමෙහි, සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් එම දැන්වීම් පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| **ඉවත් කළ යුතු දිනයන්** | **ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන්** |
|---|---|
| 2015 මාර්තු මස 18 | 2016 දෙසැම්බර් මස 05 |
| 2015 මාර්තු මස 11 | 2016 නොවැම්බර් මස 28 |

කේ. ඩී. තනුක්ෂා එන්. අබේවර්දන,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්ල.

2016 ඔක්තෝබර් මස 05 වැනි දින,
ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 1645

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වන වගන්තිය යටතේ දැන්වීමයි

*මගේ අංකය* : KDS/KGK/3/2(1)/2012/LA.

උක්ත ශිර්ෂ යටතේ අංක 1926/22 හා 2015 අගෝස්තු මස 05 වැනි දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ඉහත සඳහන් දැන්වීමෙහි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් දිනයන් ආදේශ කිරීමෙන් පහත සඳහන් සංශෝධනය කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| **ඉවත් කළ යුතු දිනයන්** | **ඉවත් කළ දින වෙනුවට ආදේශ කළ යුතු දිනයන්** |
|---|---|
| 2015 අගෝස්තු මස 05 | 2016 ඔක්තෝබර් මස 27 |
| 2015 ජුලි මස 27 | 2016 ඔක්තෝබර් මස 20 |

බී. එම්. පී. ජී පී. වී. බණ්ඩාර,
ප්‍රාදේශීය ලේකම්,
මහනුවර කඩවත් සතර හා ගඟවටකෝරළේ.

2016 සැප්තැම්බර් මස 29 වැනි දින,
මහනුවර කඩවත් සතර හා ගඟවටකෝරළේ
ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

10 - 1646

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.